# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 ඔක්තෝබර් මස 27 වන දින

## II වන කොටස

## අතිරේකය

(2023.10.31 දින නිකුත් කරන ලදී)


# එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානය (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මොණරාගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 18.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානය (සංස්ථාගත කිරීමේ)

### එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

“එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානය” යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංවිධානයක්, එකී සංවිධානයේ සාමාජිකයන් එකඟ වූ රීති වලට අනුව එකී සංවිධානයට සම්බන්ධ සියලු කරුණු එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංවිධානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී භාරකාරත්වය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද එකී සංවිධානය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2023 අංක දරන එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානය සංස්ථාගත කිරීම

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින්මතු “සංවිධානය” යනුවෙන් සඳහන් කරනු ලබන) එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු “සංස්ථාපිත මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) “එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානය” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය භාවිතා කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය ලාභ නොලබන සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වේ

3. සංස්ථාපිත මණ්ඩලය විශේෂයෙන් ම ලාභ නොලබන සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වන අතර, එය සමාජයේ සහ එහි සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා පමණක් ම වේ.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

4. (1) සංස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) ශ්‍රී ලංකාද්වීපය තුල එස් ඕ එස් ළමා ගම්මාන පිහිටුවීම;

(ආ) එස් ඕ එස් ගම්මාන තුළ ජීවත්වන දරුවන් හට පවුලක ආකාරයේ පූර්ණ රැකවරණය ලබා දීම;

(ඇ) මව්වරුන් සහ ළමයින් උදෙසා ප්‍රජා මධ්‍යස්ථාන පිහිටුවීම, හර්මන් මයිනර් විද්‍යාල පිහිටුවීම හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම;

(ඈ) එස් ඕ එස් ළමා ගම්මාන රැකවරණය ලබන නව යොවුන් දරුවන් උදෙසා එස් ඕ එස් යොවුන් ගම්මාන සහ නිවාස පිහිටුවීම;

(ඉ) එස් ඕ එස් ළමා ගම්මාන සඳහා මව්වරුන්, රැකවරණය සලසන්නන් සහ අනෙකුත් සේවකයන් තෝරා ගැනීම සහ පුහුණු කිරීම;

(ඊ) පවුලක ආකාරයේ රැකවරණ ක්‍රියාවලිය සහ අනෙකුත් ළමා සුභසාධන සංකල්ප පිළිබඳ මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය ජාල හරහා පුද්ගලයින්, සංවිධාන හා මහජනතාව දැනුවත් කිරීම; සහ

(උ) එස් ඕ එස් ළමා ගම්මාන ජාත්‍යන්තර සංවිධානය හා සම අරමුණු ඇති මේ හා සමාන දේශීය, විදේශීය සංවිධාන සමඟ සහයෝගිතාවයෙන් කටයුතු කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී-පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙනයම් හේතුවක් මත පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලය වගබලා ගත යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමඟ සංස්ථාවේ කාර්ය, ගැටුම් සහගත නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

5. ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

6. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 8 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලැබූ සංගමයේ මණ්ඩලය, 8 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම කමිටුව පත් කරනු ලබන හෝ තෝරා පත් කරනු ලබන තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ මණ්ඩලය වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වසරක් ඇතුළත සංස්ථාවේ පළමු මණ්ඩලය පත්කිරීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරු හා උපදේශකවරු ද ඇතුළුව මණ්ඩලයේ ධුර දරන සෑම ධුර දරන්නකුම වර්ෂ තුනක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරා පත් කර ගත යුතු අතර, එම වර්ෂ තුනක කාල සීමාව ඉකුත් වීමෙන් පසුව එම ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු වන්නේය.

(ආ) යම් ධුර දරන නිලධරයකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, මණ්ඩලය විසින් සංස්ථාවේ රීති සැළකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගත යුතු හෝ පත්කර ගත යුතු ය.

(ඇ) (ආ) ජේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

7. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ ඒ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා හා කාරණා කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය :-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීමට සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව සුදුසු යැයි සැලකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව ණයට ගැනීම හෝ රැස්කිරීම සහ මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාව වෙත ලබාදෙනු ලබන විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කමිටුව විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනු දෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් කමිටුව විසින් තීරණය කරනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ඉඩකඩම් හෝ පෞද්ගලික දේපළකට බලපාන්නා වූ යම් නීතිමය භාරයක් හා කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරන ලද වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම; සහ

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ සිදු කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**8.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත සඳහන් සියලු කරුණු හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:-

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ පත්වීම, බලතල, කාර්ය හා කර්තව්‍ය සහ කොන්දේසි සහ නියමයන් ;

(ඈ) මණ්ඩලයේ හෝ එහි යම් අනුකමිටුවක රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) පොදුවේ සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්ම එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ජින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සැම කල්හි ම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය

**9.** සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරන ලද සාමාජිකයන්ගේ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**10.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල්, කමිටුව විසින් අනුමත කරන ලද බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාපිත මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**11.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද , එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

**වාර්ෂික වාර්තාව**

12. (1) කමිටුව විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා ම සකස් කරනු ලැබිය යුතු අතර, එම වර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමඟ වාර්තාව අදාළ වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර සමාජ සේවා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමඟ යැවිය යුතු ය.

**සංවිධානය විසින් ගෙවිය යුතු සහ සංවිධානයට අය විය යුතු ණය**

13. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංවිධානය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංවිධානයට අයවිය යුතු සියලු ණය සහ සංවිධානයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව**

14. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**මුදල් සහ දේපළ අදාළ කර ගැනීම**

15. කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**16.** (1) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකුගේ ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි මණ්ඩලයේ යම් ධුර දරන නිලධරයකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරි වන දේපළ

**17.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයින් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් සභාවේ යම් මහා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**18.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**19.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.